# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2051/7 – 2017 දෙසැම්බර් 26 වැනි අඟහරුවාදා – 2017.12.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2017/82.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

සමස්ත ලංකා වෙළෙඳ හා කර්මාන්ත කම්කරු සංගමය, අංක 457, ආචාර්ය කොල්වින් ආර්.ද සිල්වා මාවත, කොළඹ 02.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

01. ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, 12 වන මහල, පාර්ක්ලන්ඩ් ගොඩනැගිල්ල, අංක 33, පාර්ක් වීදිය, කොළඹ 02.
02. වීරසිංහ මැන්පවර් සප්ලයර්ස් (පුද්ගලික) සමාගම, අංක 333ඒ, නුවර පාර, කිරිල්ලවල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක 77, ටී. පියසෝම මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය.

2017 දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

1A – G 26850 – 17 (2017/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/02/2017/82.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

සමස්ත ලංකා වෙළෙඳ හා කර්මාන්ත කම්කරු සංගමය, අංක 457, ආචාර්ය කොල්වින් ආර්.ද සිල්වා මාවත, කොළඹ 02.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

01. ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, 12 වන මහල, පාර්ක්ලන්ඩ් ගොඩනැගිල්ල, අංක 33, පාර්ක් වීදිය, කොළඹ 02.
02. වීරසිංහ මැන්පවර් සප්ලයර්ස් (පුද්ගලික) සමාගම, අංක 333ඒ, නුවර පාර, කිරිල්ලවල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

01. සේවකයින්ට ප්‍රසාද දීමනා ගෙවීමේදී වැඩ කරන දින ගණන නිවැරදිව පදනම් කරගෙන හා අනුමත නිවාඩු දින ඇතුළත්ව ප්‍රසාද දීමනා නොගෙවීමෙන්,

02. 2016 වර්ෂයට වැටුප 30%කින් වැඩි කිරීම යන ඉල්ලීම් සේව්‍යයා විසින් ඉටු නොකිරීමෙන් සහ,

03. සේවකයන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමේදී පොදු ක්‍රමයක් අනුගමනය නොකර ගොවිපලවලට අනුයුක්ත විවිධ නිලධාරීන් විසින් සේවකයන් සම්බන්ධ විනය ක්‍රියාමාර්ග ගැනීමෙන් සේවකයින් හට අසාධාරණයක් සිදුව තිබේද? යන්න හා එසේ සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් මොනවාද? යන්න පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 දෙසැම්බර් මස 06 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

01 - 264

---

මගේ අංකය: IR/COM/03/2016/128.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්.එම්. පොඩිමැණිකා මිය, ආර්.ජී. කරුණාරත්න මයා (බාරේ), ලංකා සීනි (පුද්ගලික) සමාගම, බුත්තල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම, අංක 27, මෙල්බන් ඇවනියු, කොළඹ 04.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතලේ, මේල්පිටිය, අංක 75, එස්. කාරියවසම් මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය.

2017 දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2016/128.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්.එම්. පොඩිමැණිකා මිය, ආර්.ජී. කරුණාරත්න මයා (බාරේ), ලංකා සීනි (පුද්ගලික) සමාගම, බුත්තල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම, අංක 27, මෙල්බන් ඇවනියු, කොළඹ 04.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''බුත්තල පැලවත්ත සීනි සමාගමේ සේවිකාවක වශයෙන් සේවය කර විශ්‍රාම යැමෙන් අනතුරුව 2015.03.09 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලබා දී තිබූ වසරක කොන්ත්‍රාත් සේවා ගිවිසුම ආපසු ලබා ගෙන 2015.03.31 දින සිට ආර්.එම්. පොඩි මැණිකා මහත්මියගේ සේවය අවසන් කිරීමෙන් ඇයට අසාධාරණයක් සිදුව තිබේද? යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඇයට හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව'' වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 දෙසැම්බර් මස 04 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

01 – 265

---

මගේ අංකය: IR/COM/02/2016/157.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජාතික සේවක සංගමය, අංක 416, කෝට්ටේ පාර, පිටකෝට්ටේ. (සේවකයන් 20 දෙනෙක් වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම, අංක 27, මෙල්බන් ඇවනියු, බම්බලපිටිය, කොළඹ 04.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක 77, ටී. පියසෝම මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය.

2017 දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2016/157.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජාතික සේවක සංගමය, අංක 416, කෝට්ටේ පාර, පිටකෝට්ටේ. (සේවකයන් 20 දෙනෙක් වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම, අංක 27, මෙල්බන් ඇවනියු, බම්බලපිටිය, කොළඹ 04.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

'' සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ පැල්වත්ත කර්මාන්ත ශාලාවේ සේවය කළ/ සේවය කරන පහත නම් සඳහන් සේවකයින් 20 දෙනාට රජය විසින් නිකුත් කර ඇති අංක 01/2013 දරන චක්‍රලේඛයට අනුව වයස අවුරුදු 60 දක්වා සේවා දිගු ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? එසේ සිදුව තිබේ නම් ඔවුනට හිමිවිය යුතු සහන මොනවා ද යන්න පිළිබඳව වේ.''

| | | | |
|---|---|---|---|
| 01. | එන්. ඩී. එම්. කරුණාතිලක | 11. | ආර්. එම්. ඥාණරත්න |
| 02. | ජී. එම්. එස්. බණ්ඩාර | 12. | ඩී. එම්. එස්. ආනන්ද |
| 03. | ආර්. විමලතිස්ස | 13. | ඒ. ජී. විජේතුංග |
| 04. | ඩබ්. එම්. ජයතිලක | 14. | එම්. එම්. සෝමදාස |
| 05. | ඩී. එම්. ජයසිංහ | 15. | පියසිරි ලංකාපුර |
| 06. | එල්. එන්. අමරදාස | 16. | ඩී. එම්. කුලතිලක |
| 07. | ජී. එන්. ශාන්ත | 17. | පුෂ්ප කාන්ත ගුණවීර |
| 08. | එම්. කේ. ලීලාරත්න | 18. | ආර්. එම්. පොඩිමැණිකේ |
| 09. | ආර්. ඒ. ලෙස්ලි අමරසිංහ | 19. | ආර්. එම්. කරුණාරත්න |
| 10. | එල්.බී. පාලිත | 20. | ඒ. ජී. සිරිසේන |

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 නොවැම්බර් මස 22 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

01 – 266

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.